THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 1 - Issue II
December 2021

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# නාගර්ජුන්ගේ බල්චන්මා නවකතාවේ නිරූපිත ප්‍රගතිශීලී චින්තනය පිළිබඳ අධ්‍යයනයක්

ආර්. එම්. පී. සුභාෂිණී මැණිකේ රත්නායක

ARTICLE DETAILS

Published Online & Printed
December 2021

*Author:*

**ආර්. එම්. පී. සුභාෂිණී මැණිකේ රත්නායක**
බාහිර කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය,
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.
*Email: bs19821984@gmail.com*

***Keywords:***

Realism, Progressive movement, Class consciousness, Balchanama, Culture society

## Abstract

In the bublic domain, Nagarjun is well known as Hindi poet but in his earier period of writing he made a place for himself as novelists in the genre of narrative story telling. In the proposed research work his novels are taken as a primaray. It is important to note that after independence, many traits of literary movements are observed. One of the important trait is progressive movement and ideology in literary. Nagarjun has influence of progressive movement in his writing. After independence, how Nagarjun views new emerging social and poltical conditions and what are the specificities in the context of progressive shall be studies in this research. This research tries to understand how Marxist influenced socialism has influenced the literature in the decades of sixties onwards when whole world was influenced by youth protests and debate on future of respective nation. This study comares this progressive influence in Nagarjun noveles to understand the society. Nagarjun's novel 'Balchanama' is taken as the key central text and aspects of progressiveness is an international character which attempted to show society free from exploitation by the capitalist system. One can understand Nagarju's scientific and global views through this research.

**හැඳින්වීම**

හින්දී නවකතා සාහිත්‍යයේ අධිරාජ්‍යයා ලෙස විරුදාවලිය ලත් ප්‍රේම්චන්ද් විසින් හඳුන්වා දෙන ලද 'සමාජ යථාර්ථවාදී සාහිත්‍යය', 'ප්‍රගතිශීලී සාහිත්‍යය ව්‍යාපාරය' ඔස්සේ ඉදිරියට රැගෙන යාම සිය සාහිත්‍ය භාවිතාවේ මුඛ්‍ය ලක්‍ෂය කරගත් නාගාර්ජුන් නිදහස් ඉන්දියාවේ වඩාත් ම බලපෑම් සහගත සාහිත්‍යකරුවා වශයෙන් සාකච්ඡාවට ලක් වී ඇත. අධිරාජ්‍යවාදයට එරෙහිව නිදහස් අරගලය පදනම් කරගෙන බිහිවන හින්දී සාහිත්‍යයේ නූතන යුගයේ විශිෂ්ටත්වය පැති කිහිපයක් ඇසුරෙන් නිරීක්‍ෂණය කළ හැකි ය. 1936 දී පිහිටුවන ලද 'ප්‍රගතිශීලී ලේඛක සංගමය' මූලික කරගෙන බිහි වන ප්‍රගතිශීලී සාහිත්‍ය ව්‍යාපාරය ඒ අතුරින් ප්‍රමුඛත්වයට පත් වන්නේ ය. 'නයී කහානී' (නව කෙටි කතාව) 'නයී කවිතා' (නව කවිය) යන සාහිත්‍ය ව්‍යාපාර එහි දිගුවක් ලෙස බිහි විය. එම සාහිත්‍ය ව්‍යාපාර ඔස්සේ හින්දී සාහිත්‍යයේ නූතන යුගය විසින් අත්පත් කර ගන්නා ලද සාහිත්‍ය උරුමය අද දක්වා හින්දී සාහිත්‍යයේ ගමන්මග කෙරෙහි විශාල බලපෑමක් එල්ල කරන බව විචාරකයෝ පෙන්වා දෙති. මෙම වකකවානුවේ දී සාහිත්‍යකරණයට ප්‍රවිශ්ට වන නාගාර්ජුන් හින්දී සාහිත්‍යයේ වඩාත් ප්‍රගතිශීලී සාහිත්‍යකරුවා බව විචාරක පාඨක දෙපිරිසගේ ම මතය වෙයි.

'ප්‍රගතිශීලී සාහිත්‍ය සංකල්පය' දෘෂ්ටිවාදාත්මක එළඹුමක් ලෙස ලෝකයට හඳුන්වා දෙන්නේ යුරෝපය විසිනි. විසිවෙනි සියවසේ ආරම්භයේ ධනවාදී සූරාකෑමට එරෙහිව දියත් වුණු විවිධ අරගලවල බලපෑමෙන් 1935 දී මැක්සිම් ගොර්කිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු 'ජාත්‍යන්තර ලේඛක සංගමයේ' ප්‍රගතිශීලී සාහිත්‍ය සංකල්පය පිළිබඳ න්‍යායාත්මක පසුබිම සකස් කළ සංසිද්ධිය වන බව හින්දී සාහිත්‍ය විචාරක හංස්රාජ් රැහ්බර් පෙන්වා දෙයි. නාගාර්ජුන් විසින් රචනා කරන ලද නවකතා අතුරින් වඩාත් වැඩියෙන් සාකච්ඡාවට ලක් වූ 'බල්චන්මා' නවකතාවේ නිරූපිත ප්‍රගතිශීලී චින්තනය කෙරෙහි අවධානය යොමු කරමින් බල්චන්මා නවකතාවේ විශිෂ්ටත්වය විමර්ශනයට ලක් කිරීම මෙම අධ්‍යනයේ අරමුණ වෙයි. හින්දී සාහිත්‍යය තුළ විශේෂ අර්ථයෙන් සාකච්ඡාවට ලක් කරන ප්‍රගතිශීලී චින්තනය පිළිබඳ විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කරන ලද දෘෂ්ටිවාදාත්මක  කියවාගැනීම් පිළිබඳ අවධානය යොමු කිරීමට මෙම අධ්‍යයනයේ දී උත්සාහ ගන්නා ලදී. නිදහසින් පසුව විවිධාකාර විමර්ශනවලට බඳුන් වූ භාරතයේ දේශපාලනික සහ සාමාජික යථාර්ථය නාගාර්ජුන්ගේ බල්චන්මා නවකතාවේ ප්‍රගතිශීලී දෘෂ්ටියට බලපෑම් ඇති කළ ආකාරය මෙම විමර්ශනයේ දී අවධානයට ලක් කෙරිණි. නිදහසට පෙර සහ පසුව හින්දී නවකතාවේ දෘෂ්ටිමය පාර්ශවය හැසිර වූ ප්‍රේමචන්ද් යශ්පාල් වැනි නවකතාකරුවන්ගේ මැදිහත්වීම හා නාගාර්ජුන්ගේ නවකතා සාහිත්‍ය සංසන්දනය කිරීම අධ්‍යයනයේ අරමුණ ඉෂ්ට කරගැනීම සඳහා එලදායී වන හෙයින් ඒ පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කරන ලදී. නාගාර්ජුන් ගේ බල්චන්මා නවකතාවේ නිරූපිත ප්‍රගතිශීලී චින්තනය පිළිබඳ සිදුකරන ලද මෙම අධ්‍යයනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

ය‍ක්කන්, වැද්‍යනාථ් මිශ්‍ර, යාත්‍රී, වැදේහ්, බාබා, නූතන කබීර් සහ නාගාර්ජුන් යන නම්වලින් සුපතළ කවියෙකු සහ නවකතා රචකයෙකු වූ නාගාර්ජුන් නිදහසින් පසු හින්දී සාහිත්‍යයේ වඩාත් බලපෑම් සහගත සාහිත්‍යකරුවා බව පිළිගැනීමට සාක්ෂි බොහෝ වේ. නූතන හින්දී කවිය සහ කථා සාහිත්‍යය පිළිබඳ කතිකාව සම්බන්ධයෙන් නාගාර්ජුන්ගේ විවිධ විශිෂ්ට සාහිත්‍ය නිර්මාණ සමඟ සංසන්දනය කෙරෙමින් කෙරෙන විග්‍රහ විශාල ප්‍රමාණයෙන් හින්දියෙන් පළ වී ඇති බව පිළිගත යුතු ය.[1]

දශක ගණනාවක් තුළ සිට විවිධ දෘෂ්ටිමය ප්‍රවේශ ඔස්සේ ගොඩනැගුණු සංවාද, සාකච්ඡා සහ විචාර ඔස්සේ නිගමනයකට ලක්වූයේ නූතන හින්දී සාහිත්‍යයට සහ සාහිත්‍යකරුවාට නාගාර්ජුන්ගේ සාහිත්‍යය ඔස්සේ ලැබුණු බලපෑම පිළිබඳ කතිකාව බව නිරීක්ෂණය කළ හැකි ය. හින්දී ලේඛකයෙකු වන ශෝභාකාන්ත් මිශ්‍ර විසින් පළ කරන ලද මේරේ බාබූජී නාගාර්ජුන් කා රචනා ජගත් නම් ලිපියේ නාගාර්ජුන්ගේ සාහිත්‍ය මැදිහත්වීම පිළිබඳ පවසන ඔහු බහුභාෂී රචනාකරුවකු වූ නාගාර්ජුන් සමාජය හා ප්‍රතිබද්ධ වූ සාහිත්‍යකරුවෙකු වශයෙන් සලකා සමකාලීන සමාජ ප්‍රගතිය උදෙසා නාගාර්ජුන්ගෙන් වූ සේවාව අගය කරයි. ''නාගාර්ජුන් හින්දී සාහිත්‍යයේ ප්‍රගතිවාදී සාහිත්‍ය ධාරාවේ පළමු වකවානුවේ රචනාකරුවෙකි. සංස්කෘත, මැථිලී සහ හින්දී කාව්‍යයේ සමෘද්ධිමත් කාව්‍ය පරම්පරා ආත්මීය කරගනිමින් මුවහත් පැනක් සමඟ බහුභාෂී රචනාකරුවෙකු ලෙස නාගර්ජුන්ගේ දෘෂ්ටිවාදාත්මක එළඹුම සමකාලීන යුගයේ විශිෂ්ටතම හඳුනා ගැනීම බවට ඔහුව පත් කරවයි. විප්ලවය, සමානාත්මතාවය, සමාජ ප්‍රගතිය හා ජනහිතවාදය යන සංකල්ප අර්ථයෙන් පමණක් නොව ව්‍යවහාරයෙන් ද ඔහු තුළ මුල් බැසගෙන තිබිණි. ඔහුගේ පුද්ගල ජීවිතය හා ඉහත සංකල්ප අතර ඇති ප්‍රතිබද්ධතාවය නාගාර්ජුන්ගේ නිර්මාණ ඔස්සේ හැමවිටම හෙළිදරව් වෙයි...''[2]

ඒ අනුව අපට පැහැදිලි වන්නේ ප්‍රේම්චන්ද් ගෙන් පසු හින්දී කවියේ සහ නවකතාවේ ගමන් මඟ කෙරෙහි දැවැන්ත බලපෑමක් ඇති කළ සාහිත්‍යමය මැදිහත්වීම වන්නේ නාගාර්ජුන්ගේ මැදිහත්වීම බව ය. නවකතා දහනවයක් සහ කාව්‍ය සංග්‍රහ තිහක් ඔස්සේ සිදුකළ එම මැදිහත්වීම, පොදු ජනතාවගේ සාහිත්‍යකරුවා බවට නාගාර්ජුන්ව පත් කරවයි. සමකාලීන භාරතීය සමාජයේ පැවති සමාජ විකෘතිතා පෙරදැරි කරගත් අමානවීය සමාජ ක්‍රමයට එරෙහිව සමාජ විප්ලවීය එළඹුමකට පොදු ජනතාව ඒකරාශි කිරීම සඳහා ගාන්ධිවාදය, මාක්ස්වාදය හෝ වාමාංශික ව්‍යාපාරවල බලපෑමට වඩා වැඩි භූමිකාවක් ඉටු කරන ලද්දේ නාගාර්ජුන්ගේ සාහිත්‍යය මැදිහත්වීම බව නිරීක්ෂණය කළ හැකිය. ඊට හේතුව සමාජය

1 බලන්න. සෝන්ටක්කේ, මාධව ගෝරේ, භාරතී (2011) නාගාර්ජුන් ඕ'ර් ප්‍රගතිශීලී සාහිත්‍යය, නයී දිල්ලිඃ ස්වරාජ ප්‍රකාශන්. සිංහ්, විජයබහාදූර්. (2009). නාගාර්ජුන් කා රචනා සංසාර්, නයී දිල්ලීඃවාණි ප්‍රකාශන්. යාදව් සුරේන්ද්‍ර කුමාර්. (2012). නාගාර්ජුන් කා උපන්‍යාස් සාහිත්‍යය සමසාමයික් සන්දර්භ, නයී දිල්ලීඃ වාණී ප්‍රකාශන්. රාය්, ආශුතෝෂ්. (2006). නාගාර්ජුන් කා ගද්‍ය සාහිත්‍යය, නයී දිල්ලීඃරාජ්කමල් ප්‍රකාශන්.මිශ්‍ර, ශෝභාකාන්ත්.(1990). මේරේ බාබූජී නාගාර්ජුන්, නයී දිල්ලීඃවාණි ප්‍රකාශන්. සිංහ් විජය බහාදූර්. (1982). නාගාර්ජුන් රචනා සංසාර්, නයී දිල්ලීඃවාණි ප්‍රකාශන්.

2 සෝන්ටක්කේ, මාධව ගෝරේ, භාරතී (2011) නාගාර්ජුන් ඕ'ර් ප්‍රගතිශීලී සාහිත්‍යය, නයී දිල්ලිඃ ස්වරාජ ප්‍රකාශන්,4 පිටුව.

සහ නාගාර්ජුන් නම් රචනාකරුවා අතර ඇති නිරන්තර මානුෂික සම්බන්ධතාවය බව විචාරකයෝ පෙන්වා දෙති.

> ''පහත් ම පහත් යැයි හංවඩු ගැසූ
> ජනතාවගේ ජීවිතකථාව ගැන
> කවි, ගීත, කථාන්දර
> ලියමින් ආවෙමි මම...
> මන්ද
> උස් - පහත් භේදයේ භේදය
> මම හඳුනමි - හැඳින්නෙමි
> දරිද්‍රතාවයේ කුළුගල් පහර
> මා හිස මත
> පතිත වෙමින් තිබිණි...''[3]

ඉන්දියානු සමාජය තුළ නිදහසින් පසු ඇති වූ දේශපාලන සමාජ වෙනස්කම්වල බලපෑම හින්දී සාහිත්‍යයේ විවිධාකාර සාහිත්‍ය ව්‍යාපාර බිහි වීමට හේතු වූ බව අපට නිරීක්ෂණය කළ හැකි ය. ප්‍රේම්චන්ද් ගෙන් ඇරඹුණ හින්දී සාහිත්‍යයේ යථාර්ථවාදී නවකතා කලාව සමාජය කේන්ද්‍ර කරගනිමින් විකසිත වීමට ඉහත සඳහන් කළ සාහිත්‍ය ව්‍යාපාර බලපෑ ආකාරය විචාරකයන්ගේ විමර්ශනයට ලක් වී ඇත.[4] එතෙක් පැවති හුදු කලාවාදී දෘෂ්ටියට එරෙහිව දේශපාලන දෘෂ්ටියකින් සාහිත්‍යයේ භූමිකාව අර්ථකථනය කිරීමට පළමුව එඩිතර වූයේ ප්‍රේම්චන්ද් ය. ඒ පිළිබඳ ප්‍රේම්චන්ද් මෙසේ ප්‍රකාශ කරයි.

''සාහිත්‍යය යනු දේශපාලනය නමැති මඟපෙන්වන්නාගේ පිටුපසින් ගමන් කරන සංචාරකයෙකු නොව, දේශපාලනය නම් සංචාරකයාට මඟ එළි පෙහෙළි කිරීමට ආලෝකය සපයන හුළු අත්තකි.''[5] ප්‍රේම්චන්ද්ගෙන් පසුව සාමාන්‍ය පොදු ජනතාවගේ ජීවන සුගන්ධය නවකතා ආඛ්‍යානය හා මුසුකොට නාගාර්ජුන් විසින් හින්දී නවකතාවට පත්කළ සාමාජික වටිනාකම සාකච්ඡාවට ලක් වී ඇත. උත්තර භාරතයේ විවිධ ප්‍රාථමික ප්‍රදේශ වාස භූමිය කරගත් ජන සමුදායගේ විවිධත්වය විසින් ප්‍රේරණය කරනු ලැබූ යථාර්ථය නාගාර්ජුන්ගේ නවකතාවේ වස්තුවිෂය වී ඇත. එහි දී නාගාර්ජුන්ගේ සාහිත්‍යය පිළිබඳ වඩා ඇගයීමට ලක්වන්නේ භූමි හීන, කුල හීන, දලිත්[6], ගොවි, කම්කරු යන සකලවිධ පීඩනයට ලක් වන පාර්ශව වෙනුවෙන් අරගල භූමියට පිවිසීමට දරන එඩිතරභාවයයි. නාගාර්ජුන්ගේ නවකතාව පිළිබඳ සාකච්ඡා කරමින් සුරේන්ද්‍ර කුමාර් යාදව් මේ පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි.

---

3 මිශ්‍ර ශෝභාකාන්ත් .(1990). මේරේ බාබූජී නාගාර්ජුන්, නයී දිල්ලීඃවාණී ප්‍රකාශන්, 42 පිටුව.
4 බලන්න, සිංහ් නාම්වර්. (2010). ප්‍රේම්චන්ද් ඕ'ර් භාරතීය සමාජ්, නයී දිල්ලීඃරාජ්කමල් ප්‍රකාශන්.
5 රැහ්බර් හංස්රාජ්. (2006). ප්‍රේම්චන්ද් ජීවන්, කලා ඕ'ර් කෘතිත්ව, දිල්ලී ඃ**සාක්ෂි ප්‍රකාශන්, 220 පිටුව.**
6 "සාමාජීය ආර්ථික ධාර්මික යන සෑම ආකාරයකින්ම යටපත් කරන ලද සමාජ කොටසයි හින්දු ධර්මයේ වර්ණ භේදයට අනුව සමාජයේ අන් කොටස්වලට ලැබෙන කිසිදු වරප්‍රසාදයක් මොවුන් ට හිමි නොවෙයි." **බාහරී, හර්දේව්. (? ). බ්‍රිහත් කෝෂ්, නයී දිල්ලීඃවාණී ප්‍රකාශන්, 528 පිටුව.**

''මූලික වශයෙන් නාගාර්ජුන්ගේ නවකතා සාහිත්‍ය සමකාලීන සමාජයේ සංවේදීතාවල ඉතිහාසය ලෙස සැලකිය හැකි ය. ඔහුගේ සෑම වචනයකින් ම විද්‍යමාන වන්නේ ජන ජීවිතයේ යථාර්ථයි. නාගාර්ජුන් විසින් චිත්‍රණය කරන ලද පොදු ජන සමුදාය විසින් අත්දකිනු ලබන ජීවන සංසිද්ධි සමකාලීන සමාජය පිළිබඳව පරිපූර්ණ කතිකාවක් ආරම්භ කිරීමට මඟ පාදා දෙයි. සමාජ ක්‍රමය වෙනස් කිරීමට සිදු කරන අරගලය පිළිබඳව දැඩි ලෙස විශ්වාස කළ හෙතෙම, එම පරිවර්තිත දෘෂ්ටිකෝණය ඔස්සේ සමාජ සංදර්භය තුළ මෙතෙක් විවෘත නොවූ, ස්පර්ශ නොවූ පුළුල් ජන-කොටසක් පිළිබඳ අදහස පාඨකයාට අනාවරණය කරයි. සමාජය තුළ ආවරණයට ලක් නොවූ එම බහු ජන කොටස අරගලය වෙත මෙහෙයවීමේ දී නාගාර්ජුන් පැහැදිලි ලෙසට ප්‍රේම්චන්ද්ට වඩා ඉදිරි පියවරක් තබයි.''[7]

නාගාර්ජුන්ගේ නවකතා කෙරෙන් ප්‍රතිවිරෝධය සහ අරගලය, වර්ධනය ක්‍රියාවලියක් ලෙස විද්‍යමාන වන්නේය. සමාජය හා සම්මිශ්‍රණය වූ සිය ජීවන අත්දැකීම් තුළින් මුවහත් වූ අරගලය සමඟ ඔහු තුළ පැවති සමීප හැඟීම නිසා එම විරෝධය සහ අරගලය ඔහුගේ නවකතා තුළට ප්‍රවේශ විය. දහඩිය ලේ බවට පත් වනතුරු වෙහෙසවීමෙන් පසුවත් තම මූලික අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට අසමර්ථ ඉන්දියාවේ සියයට අසූවක ප්‍රතිශතයකින් යුතු ජනතාවට, ජීවන නිදහස ලබා ගැනීමේ උපාය මාර්ගය ලෙස, නාගාර්ජුන් එම නවකතා සංවිධානය කරයි. ඒ පිළිබඳ නාගාර්ජුන් විසින් ම ප්‍රකාශ කරන ලද්දේ මෙසේ ය.

''ඉඩම් හිමියන්ගේ ණය - පොලී ගෙවීම සඳහා තම අස්වැන්න බිලිදෙන ගොවියන්, කුසට අහරක් සඳහා පමණක් කුලී වැඩ කරන ගැමියන්, ජීවිත කාලය පුරාම රදළයන්ගේ බැල මෙහෙවර කරන දුප්පතුන්, කරත්ත දක්කන්නන්, මුට්ට කරගසන්නන්, මහල්ලන් සහ ළමුන් මගේ ලේඛනය නමැති කුටුම්භයේ නිත්‍ය සාමාජිකයන් වේ.''[8]

නිදහසින් පසු ඉන්දියාවේ සාමාන්‍ය ජන සමාජයේ දෘෂ්ටිවාදී ප්‍රකාශනය නාගාර්ජුන් තරමට වෙනත් හින්දී ලේඛකයෙකු කෙරෙන් විදාරණය නොවුණු ආකාරය අපට නිරීක්ෂණය කළ හැකි ය.

ඉන්දියාවේ ස්වයං පරිපූර්ණ අනන්‍යතාවය අධිරාජ්‍යවාදී යටත් විජිත පාලනය විසින් කෲර ලෙස බිඳ දැමුණු සමාජ පසුබිමක නාගාර්ජුන් රචනාකරණයට පිවිසෙයි. සමකාලීන සමාජයේ මූලික ප්‍රතිවිරෝධය පාලක - පාලිත ඉඩම් හිමියන් ගොවියන් සහ ධනපති - කම්කරු යන දෙපිරිස අතර විහිදී තිබූ බව ඉතිහාසඥයන් විචාරකයන් අතර පොදුවේ ප්‍රචලිතව පවතියි. විසිවෙනි සියවසේ මධ්‍ය භාගයේ දී ඉන්දියාවේ ගොවි අරගලය සක්‍රීය ලෙස ජන සමාජය අවදි කළ ආකාරය හින්දී සාහිත්‍යයේ විශේෂ සාකච්ඡාවට ලක් වී ඇත.[9] උත්තර් ප්‍රදේශ් සහ බිහාර් ප්‍රාන්තවල සක්‍රීයව පැවති ගොවි අරගලවලට ප්‍රබල ක්‍රියාධාරියෙකු ලෙස නාගාර්ජුන් සහභාගී වෙයි. ඒ සඳහා මූලික වන කාරණා නාගාර්ජුන් හට බලපෑවේ

7 යාදව්, සුරේන්ද්‍ර කුමාර්. (2012). නාගාර්ජුන් කා උපන්‍යාස් සාහිත්‍යය, සමසාමයික් සංදර්භ, නයී දිල්ලී:වාණී ප්‍රකාශන්, 27 පිටුව.

8 රාය්, ආශුතෝෂ්. (2006). නාගාර්ජුන් කා ගද්‍ය සාහිත්‍යය, නයී දිල්ලී:රාජ්කමල් ප්‍රකාශන්, 58 පිටුව.

9 බලන්න, තල්වාර්, වීර්භාරත්. (2010). ප්‍රේම්චන්ද් ඖර් කිසාන් ආන්දෝලන්, නයී දිල්ලී :වාණී ප්‍රකාශන්.

සමාජය සමග ඔහුගේ ස්පර්ශීය සබඳතාවය සහ ප්‍රගතිශීලී ලේඛන සංගමය විසින් සාහිත්‍යයේ එතෙක් පැවති දෘෂ්ටිවාදාත්මක ලක්ෂණ වෙනස් කිරීමට සිදු කළ බලපෑමයි. (ප්‍රගතිශීලී ලේඛන සංගමය පිළිබඳ මේ ලිපියේ පසු පිටක විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.) ඕනෑම සමාජයක පොදු චින්තන ධාරාව මත එකී සමාජයේ ආර්ථික, දේශපාලන සහ සමාජ ජන මතය ගොඩනැගී ඇති ආකාරය අපට වටහා ගත හැකි ය. එබැවින් සාහිත්‍යකරුවා විසින් සෑම විට ම අවිඥානිකව හෝ සවිඥානිකව සමකාලීන සමාජයේ ඓතිහාසික බලවේග නියෝජනය කරයි. ඒ පිළිබඳ ප්‍රේම්චන්ද්ගේ මතය විමසා බලමු. ''සාහිත්‍යකරුවා තම භූමියේ විවිධාකාර වූ සමාජ, ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික පසුබිම්වලින් බලපෑමට ලක්වන අතර, සමාජය තුළින්ම ජනනය වන සාමූහික බලවේගවලට මැදිහත් නොවී ඔහුට රචනාකරණයේ නියැළී සිටිය නොහැකි ය.''[10]

ප්‍රගතිශීලී චින්තනය සහ නාගාර්ජුන්ගේ නවකථාව යන පර්යේෂණ විෂය පථයට ප්‍රවිශ්ට වීමට ප්‍රථම ප්‍රගතිශීලී චින්තනය එහි පසුබිම සහ ප්‍රගතිශීලී සාහිත්‍ය පිළිබඳ පුළුල් ව විමර්ශනය කිරීම ඉතාම වැදගත් වේ. හින්දී සාහිත්‍ය ඉතිහාසය විමර්ශනය පිළිබඳ කතිකාවේ දී ප්‍රගතිශීලී සාහිත්‍යයේ ආරම්භය සිදු වන්නේ කවදා ද? කුමක් පදනම් කරගෙන ද? යන පැනයට සාහිත්‍ය විචාරකයන් විසින් විවිධ මත පළ කරන ලදී. ඒ පිළිබඳ සුධාකර් ශෝඩංගේ 'ප්‍රගතිශීලී සාහිත්‍යයේ විචාරාත්මක පසුබිම' යන ලිපියේ මෙසේ සඳහන් කරයි.

''ඇතැම් විචාරකයන් විසින් ප්‍රගතිශීලී සාහිත්‍යයේ ආරම්භය 1936 දී පිහිටුවන ලද 'ප්‍රගතිශීලී ලේඛන සංගමය'ට සමගාමීව සිදුවන බව පිළිගන්නා ලද අතර, තවත් විචාරකයන්ගේ මතයට අනුව එය ප්‍රාරම්භික හින්දී සාහිත්‍යයේ සිට අද වන තුරු ප්‍රවාහයක් ලෙස විද්‍යමාන වන ගුණයකි.''[11]

කෙසේ වෙතත් 'ප්‍රගතිශීලී සාහිත්‍යය' සංකල්පය නූතන යුගයේ සාකච්ඡාවට බඳුන් වී ඇති විශිෂ්ට අර්ථයට අනුව හින්දී සාහිත්‍යයේ දී  කතිකාවට ලක්වී ඇත්තේ 'ප්‍රගතිශීලී ලේඛක සංගමයේ' පිහිටුවීමට සමාන්තරව ඇතිවූ දෘෂ්ටිවාදාත්මක බලපෑමෙන් පසුවය. මේ පිළිබඳ හංස්රාජ් රැහ්බර් විසින් 'ප්‍රගතිවාද් පුනර් මූල්‍යාන්කන්' නම් සිය කෘතියේ සිදු කරන ලද දීර්ඝ විස්තරයෙන් කොටසක් උපුටා දක්වමි.

''... 'අඛිල් භාරතීය ප්‍රගතිශීලී ලේඛක සංගමය' පිහිටුවීම සඳහා මූලික අඩිතාලම දමන ලද්දේ 1936 ලන්ඩන් නුවරදී ය. ඒ සඳහා මූලික පියවර ගන්නා ලද්දේ උසස් අධ්‍යාපනය සඳහා යුරෝපය බලා ගොස් එහි ජීවත් වූ ඉන්දියානු තරුණ බුද්ධිමතුන් කිහිප දෙනෙක් විසිනි. යුරෝපයේ එවකට පැවති කම්කරු හා ශිෂ්‍ය අරගල මෙන් ම විවිධ සාහිත්‍ය ව්‍යාපාරවල ප්‍රවාහය ලැබූ ඔවුහු සමාජවාදී දර්ශනය දෙසට නැඹුරුව සිටිය හ. මාක්ස් ලෙනින් ඇතුළු ලේඛකයින්ගේ පත-පොත මහත් උද්යෝගයෙන් කියවූ ඔවුහු කොමියුනිස්ට්

10 විමලා, එම්.(2003). ප්‍රේම්චන්ද් කේ උපනාසාසෝ් කී සමස්‍යා, නයී දිල්ලී :වාණී ප්‍රකාශන්, 74පිටුව.

11 සෝන්ටක්කේ, මාධව ගෝරේ, භාරතී (2011) නාගාර්ජුන් ඕ'ර් ප්‍රගතිශීලී සාහිත්‍යය, නයී දිල්ලිඃ ස්වරාජ ප්‍රකාශන්,439 පිටුව.

සමාජයක් තුළ මානවයා මුහුණ දෙන ගැටළුවලට විසඳුම් ලැබෙන බව විශ්වාස කළහ. 1935 දී පැරිසියේ දී ගෝර්කි ගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික සංරක්ෂණය උදෙසා 'අන්තර්ජාතික ලේඛනයන්ගේ සම්මේලනය' පැවැත්විණි. එහි අරමුණ වූයේ පැසිස්ට්වාදය සහ අධිරාජ්‍යවාදයේ ම්ලේච්ඡත්වය හේතු කොටගෙන ස්වතන්ත්‍ර අදහස්වලට ඇති වන විශාල ප්‍රහාරය පිටු දැකීමත් ඊට එරෙහිව ලේඛකයන්ගේ අයිතිය සුරක්‍ෂා කිරීමත් ය. මෙයට සහභාගී වූ සියළුම ලේඛකයෝ සහ බුද්ධිමත්හු පැසිස්ට්වාදය සහ අධිරාජ්‍යවාදයට එරෙහිව ඒ වන විටත් යුරෝපය පුරා බිහි වූ කම්කරු සහ ශිෂ්‍ය අරගලවලට සහභාගී වූවෝ වූහ. මීට සමගාමී ව ඉන්දියානු තරුණ බුද්ධිමත්හු ලන්ඩන් නුවර 'භාරතීය ප්‍රගතිශීලී ලේඛක සංගමය' නමින් සංවිධානයක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සංවිධානය කළහ. මෙම සංගමය පිළිබඳ අදහස ඔවුන් විසින් ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලවල ඉගනුම් සහ ඉගැන්වීම්වල නිරත වූ ඉන්දියානු සාහිත්‍ය ප්‍රේමීන් අතරට රැගෙන යන ලදී. එවක ලන්ඩන් නුවර ජීවත්ව සිටි ඉන්දියානුවන් 40 - 50 ක් පමණ රැස් කරගත් භාරතීය ප්‍රගතිශීලී ලේඛක සංගමයේ සංවිධායකවරු, තම සංගමයේ ප්‍රකාශ පත්‍රය සකස් කිරීම ඊළග වැදගත් කර්තව්‍යය ලෙස සැලකූහ. ප්‍රගතිවාදය යනු කුමක් ද? ප්‍රගතිශීලී ලේඛකයන්ගේ අරමුණු මොනවාද? ඔවුන් එම කර්තව්‍යය ඉටු කළ යුත්තේ කෙසේද? යන මූලික කරුණු ඇතුළත්ව එම ප්‍රකාශ පත්‍රය ඔවුන් විසින් සූදානම් කරන ලදී. 'ලන්ඩන් නුවර භාරතීය ප්‍රගතිශීලී ලේඛක සංගමය' අනිවාර්ය ලෙසට ජාත්‍යන්තර සාහිත්‍ය කේන්ද්‍රස්ථානය සමඟ සම්බන්ධතාවය පවත්වාගත් අතර ඉන්දියාව තුළ 'ප්‍රගතිශීලී ලේඛකයන්ගේ සංගමයක්' පිහිටුවාලීමට කටයුතු සංවිධානය කිරීම ඔවුන්ගේ ඊළඟ අරමුණ විය. ලන්ඩන් නුවර 'භාරතීය ලේඛක සංගමයේ' සභාපතීත්වය දැරූ ආචාර්ය සජ්ජාද් සාහිර් විසින් ඔවුන්ගේ ප්‍රකාශ පත්‍රය ඉන්දියානු ලේඛකයන් වෙතට තැපැල් මඟින් යවන ලදී. ඉන් අනතුරුව එම සංගමයේ ප්‍රතිපත්තිවලට එකඟතාවය පලකරමින් ඔවුන්ගේ ප්‍රකාශ පත්‍රය මහත් හරසරින් පිළිගත් මුංශී ප්‍රේම්චන්ද් 'හංස්' සඟරාවට ඒ පිළිබඳව මෙසේ ලිව්වේ ය. ''...ඔවුන් විසින් අප අතට පත් කරන ලද ප්‍රකාශ පත්‍රය කියවීමෙන් මට හැඟී ගියේ ඔවුන් පෙන්වා දෙන මාර්ගය ඔස්සේ ගමන් කිරීම තුළින් සාහිත්‍යයේ නව යුගයක් නිර්මාණය වන බව ය.'' එහි ප්‍රතිඵලයක් ලෙස 1936 අප්‍රේල් මාසයේ දී ලඛ්නව් නගරයේ දී ප්‍රගතිශීලි ලේඛකයන්ගේ සම්මේලනයේ පළමු සම්මේලනය ප්‍රේමචන්ද්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.''[12]

ඉහත දීර්ඝ උපුටා ගැනීමට අනුව ඉන්දියාවේ ප්‍රගතිශීලී ලේඛක සංගමයේ පිහිටුවීමේ වැදගත්කම සහ එහි බලපෑම හින්දී සාහිත්‍යය තුළ විවිධ සාහිත්‍ය ව්‍යාපාර නිර්මාණය කිරීමට බලපෑ ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. ප්‍රගතිශීලි සාහිත්‍යය පිළිබඳ සංකල්පය, සාහිත්‍ය ව්‍යාපාරයක් ලෙස ආරම්භ වන්නේ මෙම සිදුවීමත් සමඟ ය. ප්‍රගතිශීලී සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ හින්දී සාහිත්‍ය විමර්ශකයින් විසින් පළ කරන ලද විවිධ මතවාද මෙසේ පෙළගැස්විය හැකි ය.

12 රැහ්බර් හංස්රාජ්. (1991). ප්‍රගතිවාද් ඃ පුනර් මුල්යාංකන්, ඉලාහ්බාද්ඃ නවයුග් ප්‍රකාශන්, 18-19 පිටු.

''හින්දී භාෂාව ඇතුළු අනෙකුත් භාරතීය භාෂා සාහිත්‍යය තුළ ප්‍රගතිශීලී ආන්දෝලනය සැබෑ ලෙස සහ විධිමත් ආකාරයට ආරම්භ වන්නේ 1936 දී 'ප්‍රගතිශීලී ලේඛන සංගමය' පිහිටුවීමෙන් පසුව ය.''[13]

හින්දී සාහිත්‍යයේ දීප්තිමත් මාක්ස්වාදී විචාරකයෙකු වන රාම් විලාස් ශර්මා ඒ පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි.

" 'ප්‍රගතිශීලී' වචනය ඉංග්‍රීසි භාෂාවේ progresive යන වචනයේ අරුත ගෙන දෙන හින්දී පරිවර්තනය ලෙස යොදාගෙන ඇත. 1930 න් පසු ලෝකය පුරා මාක්ස්වාදී දර්ශනය හේතුකොටගෙන සාහිත්‍යමය සංස්කෘතික සහ සාමාජික වශයෙන් සිදු වූ හැලහැප්පීම් සහ එහි බලපෑම ඉන්දියානු සාහිත්‍යකරුවන්ට ඍජු බලපෑමක් එල්ල කළේ ය.''[14]

ශෝඩාංගේ සුධාකර් විසින් ප්‍රගතිශීලී සාහිත්‍යය සම්බන්ධයෙන් පළ කළ අදහස මෙහි උපුටා දැක්වීම උචිතය.

''යම් සාහිත්‍යයක් පාඨකයාට නිරන්තරයෙන් අභිප්‍රේරණයක් වේ ද, සමානාත්මතාවයේ වටිනාකම් පිළිබඳ ඉස්මතු කරන්නේ ද, මානව මුක්තිය පිළිබඳ සාකච්ඡා කරන්නේ ද පීඩිතයාගේ සූරා කෑමට එරෙහි විරෝධය පළ කරන්නේ ද, අරගලය සංවිධානය කිරීමට බලය ලබා දෙන්නේ ද, මිනිස් චින්තනය ගැඹුරු පුළුල් සහ මානවවාදී චින්තනයක් බවට පරිවර්තනය කිරීමට දායක වන්නේ ද එය ප්‍රගතිශීලී සාහිත්‍යයකි.''[15]

නාම්වර් සිංහ් ඒ පිළිබඳ සිය අදහස මෙසේ ඉදිරිපත් කරයි.

''ප්‍රගතිශිලී ලේඛක සංගමය පිහිටුවීමෙන් පසුව, ප්‍රේම්චන්ද් විසින් කතෘත්වය දරන ලද 'හංස්' මාසික හින්දී සඟරාවේ සහ කොමියුනිස්ට් පක්ෂය විසින් ප්‍රකාශයට පත් කරන ලද 'නයා-සාහිත්‍යය' නමැති මාසික සඟරාවේ වැඩි ඉඩක් වෙන් වූයේ ප්‍රගතිශීලී නිර්මාණ සඳහා ය. ප්‍රගතිශීලී හින්දී ලේඛකයෝ, අඛිල් භාරතීය ප්‍රගතිශීලී සංගමය ඔස්සේ උර්දු, බෙංගාලි, ගුජරාතී, මරාඨී, තෙලිගු සහ මලයාලම් යන භාෂාවල ප්‍රගතිශීලී සාහිත්‍යකරුවන් සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ගොඩනගා ගනිමින් තම චින්තන ධාරාව පොහොසත් කරගත් හ. මධ්‍යකාලීන යුගයේ (15 වන සියවසේ) භක්ති ආන්දෝලනයෙන් පසුව මුළු මහත් ඉන්දියාවේම සාහිත්‍ය ව්‍යාපාරයක් ලෙස ගොඩනැගීමට ප්‍රගතිශීලී සාහිත්‍ය ව්‍යාපාරයට හැකි විය. ප්‍රගතිශිලී සාහිත්‍ය ව්‍යාපාරය සතුව පැවතුණු මෙම පුළුල් සමාජ චින්තනය ඔස්සේ හින්දී සාහිත්‍යයේ නව පරම්පරාවක් බිහි විය.''[16]

---

13 සෝන්ටක්කේ, මාධව ගෝරේ, භාරතී (2011) නාගාර්ජුන් ඕ'ර් ප්‍රගතිශීලී සාහිත්‍යය, නයී දිල්ලිː ස්වරාජ ප්‍රකාශන්,440 පිටුව.

14 සෝන්ටක්කේ, මාධව ගෝරේ, භාරතී (2011) නාගාර්ජුන් ඕ'ර් ප්‍රගතිශීලී සාහිත්‍යය, නයී දිල්ලිː ස්වරාජ ප්‍රකාශන්,**440 පිටුව.**

15 බාබු, සෝෂ්ශේෂ්. (2006). ප්‍රගතිශිලී හින්දී ආලෝචනා ඒවං හින්දී කවිතා, නයී දිල්ලීː රාජ්කමල් ප්‍රකාශන්, 11 පිටුව.

16 සිංහ්, නාම්වර්. (2016). ආධුනික් සාහිත්‍ය කී ප්‍රවෘත්තියා, ඉලාහ්බාද්ːලෝක් භාරතී ප්‍රකාශන්, 70පිටුව.

ඒ අනුව ප්‍රගතිශීලී ලේඛන සංගමයේ පිහිටුවීම එතෙක් භාරතීය සාහිත්‍යයේ පැවති මිනුම් දඬු නිර්වචන වෙනස්වීමට බලපෑම් කළ ආකාරය විමර්ශනයට ලක් කළ හැකි ය. එහි ප්‍රතිඵලය ලෙස හින්දී සාහිත්‍යයේ එතෙක් දක්නට නොලැබුණු ගුණාත්මක පරිවර්තනයන් කෙරෙහි විශාල දැක්මක් ඇති වූ ආකාරය හඳුනාගත හැකි ය. එම දැක්ම වැඩවසම් චින්තනයට සෘජුවම අභියෝගයක් එල්ල කරන්නට විය. නාගාර්ජුන් එම සාහිත්‍ය භාවිතාවේදී උකහාගන්නේ ප්‍රගතිශීලී සාහිත්‍යයේ මෙම දෘෂ්ටිමය ප්‍රවේශයයි. ඒ පිළිබඳ සාකච්ඡා කරමින් සුරේන්ද්‍ර කුමාර් යාදව් මෙසේ ප්‍රකාශ කරයි.

''...නාගාර්ජුන් හින්දී සාහිත්‍යයේ ප්‍රගතිශීලී තරු ලකුණයි. නාගාර්ජුන්ගේ සෑම නිර්මාණයක් කෙරෙන් ම පාඨකයාට මුණගැසෙන්නේ පොරවාගත් සත්‍යයක් නොව අත්විඳින සත්‍යයක් ය. ඔහුගේ නවකථාව විකාශනය වීමේ දී ආඛ්‍යානය, සිදුවීම්, දැක්ම, හැඩ, සංවාද ආදියෙහි ඉහිරීයාමක් හෝ පමණට වඩා ගෙනහැර දක්වන වර්ණනයන්ට නතු වූ බවක් හෝ දැකගත නොහැකි ය. ඒ වෙනුවට ඇත්තේ එකිනෙකට බැඳුණු සූත්‍රයක් ය. දේශපාලන කුලක සමග සිදු කෙරෙන මතවාදී පොරබැදීම් වෙනුවට ඔහුගේ නවකථාවේ දී අපට හමුවන්නේ ග්‍රාමීය ජනපදවල සමාජීක, සංස්කෘතික ඒකකවල යථාර්ථයකි...''[17]

1950 වන විට නවකතාව හින්දී සමාජය තුළ විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන තිබූ මාධ්‍යයක් බවට පත්ව තිබිණි. මෙවන් වකවානුවක නවකතාකරණයට ප්‍රවිශ්ට වන නාගාර්ජුන් සමකාලීන සමාජ ක්‍රමය කෙරෙහි තමා තුළ පැවති උද්වේගකර විරෝධය නිරූපණය කිරීමට නවකතාව උචිත මාධ්‍ය ලෙස වටහා ගනියි. නාගාර්ජුන් විසින් රචනා කරන ලද 1952 දී ප්‍රකාශයට පත් වූ බල්චන්මා නවකතාව ඔහුගේ නවකතා අතුරින් වඩාත්ම සාකච්ඡාවට ලක් වූ නවකතාව වෙයි. බල්චන්මා කෘතිය පිළිබඳ කෙටි සාකච්ඡාවක නිරත වෙමු.

'බල්චන්මා' ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ දර්භංගා දිස්ත්‍රික්කයට අයත් පිටිසර ගමක ජීවත් වන දුප්පත් ගොවියෙකුගේ පුතෙකි. බාල්චන්ද්, බල්චන්මාගේ උපන් නම වන අතර, ඔහුගේ ජීවිතය සේම නම ද කැඩී බිඳී පළුදු වී බල්චන්මා ලෙස ව්‍යවහාර වෙයි. බල්චන්මාට වයස අවුරුදු එකොළහක් වන විට ඔහුගේ පියා මිය යයි. ඔහුගේ පියා මිය යන්නේ බල්චන්මලාගේ ස්වාමියා වූ හාමු මහත්තයාගේ වත්තෙන් අඹ ගෙඩි කිහිපයක් කඩා ගැනීමේ වරදට දඬුවම් ලෙස හාමු මහතා විසින් පමුණුවන ලද අමානුෂික වද බන්ධනවලට ගොදුරු වීමෙනි.

කතුවරයා පවසන ආකාරයට පියාගේ මරණින් පසු බල්චන්මාගේ ජීවිතය අපායක් බවට පත් වෙයි. සිය උරුමයෙන් ලැබුණු අක්කර කාලක කුඹුර හාමු මහත්තයා විසින් උදුරා ගනු ලබයි. සිය මවත්, සහෝදරියත්, පියාගේ මහලු මවත් ජීවත් කරවීමට බල්චන්මාහට පැවරී තිබේ. තම පියාව අමානුෂික ලෙස ඝාතනය කරන ලද හාමු මහතාගේ නිවසේ ම බැලමෙහෙවර කිරීම හැර වෙනත් විකල්පයක් බල්චන්මාට හමු නොවෙයි. ඒ වෙනුවෙන්

17 යාදව්, සුරේන්ද්‍ර කුමාර්. (2012). නාගාර්ජුන් කා උපන්‍යාස් සාහිත්‍යය, සමසාමයික් සංදර්භ, නයී දිල්ලීඃවාණී ප්‍රකාශන්, 89 පිටුව.

බල්චන්මාට ලැබෙන එකම වේතනය වන්නේ හැළි-වලංවල ඉතිරිවුණු ආහාර හෝ පිළුණු වූ ආහාර පමණි. නවකතාවේ හැරවුම් ලක්ෂය වන්නේ, හාමු මහතාගේ කනිෂ්ඨ පුත්‍ර රත්නය වූ මද්දූම හාමු, බල්චන්මාගේ සහෝදරිය වන රේබතීව දූෂණයට ළක්කිරීමට උත්සාහ කිරීමත් සමඟිනි. එතැන් සිට නවකතාව විකාසනය වන්නේ අරගලකාරී ස්වරූපයකිනි. බල්චන්මාට සමාජ ක්‍රියාධරයෙකු වූ ඵූල් බාබුව මුණගැසීම, ඉන් අනතුරුව ගම අතහැර ඔහු පට්නාවලට පිටත්ව යාම, එහිදී බල්චන්මා තුළ සිදුවන චින්තන ප්‍රබෝධය වැනි සංසිද්ධි විසින් 'බල්චන්මා' අරගලකාරී චරිතයක් බවට ප්‍රතිනිර්මාණය කරන ලද ආකාරය අපට හඳුනාගත හැකිය. බල්චන්මා බිහාර්යේ ගොවි අරගලයේ ක්‍රියාකාරී සටන්කරුවෙකු බවට පත් වෙයි. අරගල භූමියේ දී පාලකයන් විසින් එල්ල කරන ලද පොලු පහරකින් සිහසුන් ව බිම ඇද වැටෙන බල්චන්මා මිය යයි.

බල්චන්මා නවකතාවේ ආඛ්‍යානය; කුල හීන, භූමි හීන, පීඩිත, දලිත ජන-සමුදායගේ සැබෑ ජීවිතය ප්‍රතිනිර්මාණය කෙරෙන ගද්‍ය කාව්‍යයකි. නාගාර්ජුන් නවකතාවට ප්‍රවිශ්ට වන්නේ සරල සිද්ධි ඔස්සේ ඍජුවම බව නිරීක්ෂණය කළ හැකිය. බල්චන්මා විසින් ම තමන් පිළිබඳ සිදු කරන විස්තරයකින් නවකතාව ආරම්භ වෙයි.

"මට අවුරුදු එකොළහේ දී අප්පොච්චි මැරුණා, ගෙදර මමයි, අම්මයි, කිරි අම්මයි, නංගියි විතරයි. ගෙදරක් කිව්වට ඒක පැල්කොටයක්. පේන දුරින් බඹ දහයක් දොළහක් දිග, බඹ හතක් අටක් පළල හාමු මහත්තයලාගේ උළු ගෙදර. ඊට ඉස්සරහින් කමතක් තරම් ලොකු මිදුලක්. ඊට ඉස්සරහින් හාමු මහත්තයාට අයිති කුඹුරු යාය. පිටිපස්සේ එයාලගේ හරක් පට්ටිය"[18]

බල්චන්මාගේ උක්ත ස්වයං විවරණය ඔස්සේ නාගාර්ජුන් පැහැදිලි කිරීමට උත්සාහ කරන කරුණු දෙකක් විමර්ශනයට ලක් කළ හැකි ය. එනම් බල්චන්මාත්, හාමු මහත්තයාත් නියෝජනය කරන එකිනෙකට ප්‍රතිවිරුද්ධ පංති ස්තර දෙක පිළිබඳ අදහසයි. අනෙක් කරුණ නම්, එම ප්‍රතිවිරුද්ධ බලවේග අතර ගැටුම, නවකතාවේ විකාසනයට සහ නවකතාවේ අවසන් ප්‍රතිඵලයට සිදු කරන බලපෑම පිළිබඳ අදහසයි. නාගාර්ජුන් විසින් බල්චන්මා නවකතාව පුරාම නිරූපණය කිරීමට උත්සාහ කරන ලද පංති අතර ගැටුමට අවශ්‍ය බීජ මෙම පළමු ප්‍රවේශයේ ම වැපිරී තිබෙන ආකාරය උක්ත උපුටාගැනීම තුළ අපට නිරීක්ෂණය කළ හැකි ය.

බල්චන්මාගේ ජීවිතය පුරා හෙතෙම අත්දුටු දරුණුම සිදුවීම සිය පියාගේ මරණයයි. එම සිදුවීම ඔහුගේ මතකයෙන් කෙදිනකවත් බැහැර නොවෙයි. හාමු මහතා විසින් පමුණුවන ලද වධබන්ධනයට ළක්වන බල්චන්මාගේ පියාගේ මරණාසන්න මොහොත අනුවේදනීය චිත්‍රයකට නඟන නාගාර්ජුන් මෙසේ ලියයි.

"හාමු මහත්තයාලගේ ගෙදර කෙළවරක කණුවකට අප්පච්චිව මහ කබයකින් ගැට ගහලා; කළව, පිට, අත් මේ හැමතැනම වේවැල් පහරවල් වැදිලා ඉළිප්පිලා, තුවාල වුණු

18 නාගාර්ජුන්.(1987). බල්චන්මා, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්, 1 පිටුව.

තැන්වල හම ගැලවිලා; මූණ කළු ගැහිලා, ඉදිමිලා ඇස් වලින් සට සට ගාලා කඳුළු වැටෙනවා. ඒත් කඳුළු පපුව දිහාවට යනකොට වේළෙනවා. තොල් දෙක කෙහෙල් පඬරුලක් වගේ වේළිලා. ඊට ටිකක් ඈතින් සිමෙන්ති පඩියේ මද්දුම හාමු යම රජ්ජුරුවෝ වගේ ඉදගෙන. අපේ කිරි අම්මා, හාමු මහත්තයාගේ කකුල් දෙක අත් දෙකෙන්ම බදාගෙන 'මගේ කොල්ලව බේරලා දෙන්න දෙයියෝ' කියලා ලතෝනි දෙනවා. ඒ මැද්දේ ඉදගෙන අම්මා පස් කකා විලාප දෙනවා. මමත් අඬනවා. අපේ නංගි බයටම ගොළු-බිරී වෙලා බලාගෙන...."[19]

යථෝක්ත උපුටා ගැනීමෙන් පෙනී යන්නේ කුලීන, ඉඩම් හිමි පංතිය විසින් 'බල්චන්මා' නියෝජනය කරන කුල හීන, ඉඩම් අහිමි පීඩිතයාව ම්ලේච්ඡ ලෙස පීඩනයට පත් කරන ආකාරයයි. බල්චන්මාගේ නැගණිය රේබතී, දූෂණයට ළක්කිරීමට මද්දුම හාමු ගන්නා උත්සාහය සමඟම එම සිද්ධිය නවකතාවේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත් වෙයි. එතැන් සිට පංති අතර ප්‍රතිවිරෝධය සහ ඊට එරෙහි අරගලය පැහැදිලි ලෙසටම පාඨකයාට අභිමුඛ වෙයි. සමාජය වසාගෙන පැතිර පවතින වැඩවසම් අගතිවලට මෙන්ම සමාජය පුරා දළුලා වැඩෙන ධනවාදී විකෘතිතාවලට නිර්භයව නාගාර්ජුන් විරෝධය දක්වන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. පීඩනයට නතුවන සමාජ ස්ථරය නියෝජනය කරන, චරිත තුළ අරගලකාරී ගුණාංග ඉතා සංවිධානාත්මකව ඉස්මතු කිරීමට නාගාර්ජුන් සමත් වෙයි. බල්චන්මාගේ නැගණිය තුළ තම නිදහස වෙනුවෙන් අරගල කිරීමේ ප්‍රවේශය නාගාර්ජුන් චිත්‍රණය කළ ආකාරය විචාරකයන්ගේ සාකච්ඡාවට ලක් වී ඇත. මද්දුම හාමුගේ ලිංගික සූරා කෑමට එරෙහිව රේබති තනිව සටන් කළාය. කාමාතුර යක්ෂයාගේ ග්‍රහණයෙන් මිදීයාම සඳහා ඇය ඔහුට පහර දුන්නාය. තම දත්වලින් මද්දුම හාමුව සපා කෑවාය. 'දූෂණයට' එරෙහිව නැඟී සිටින එවැනි කාන්තා චරිත හින්දී සාහිත්‍යය තුළ මීට පෙර අපට හමු නොවෙයි. උක්ත සිද්ධිය සම්බන්ධව බල්චන්මාගේ මැදිහත්වීම තුළින් නාගාර්ජුන් පීඩිත පංතිය සතු අරගල කිරීමේ ශක්‍යතාව නිරූපණය කරන්නේ මෙසේය.

"මං හිරේ යනවා, එල්ලුම් ගහට යනවා, ගමෙන් පැනලා යනවා. ඒත් උඹලා වගේ තිරිසනුන්ට ඔළුව නමන්නේ නෑ. ඔව් මම නිකම්ම නිකම් දුප්පතෙක්. උඹට සැප සම්පත් තියෙනවා, කුලය, පරම්පාරව, උරුමයෙන් ලැබුණු නම්-වාසගම්, ලොකු ලොකු තැන්වල හැඳුනුම්කම්, ලොකු ලොක්කන්ගේ උදව්-පදව් තියෙනවා. ඒ මොනවත් මට නෑ. හැබැයි මැරෙනකම් මම උඹත් එක්ක සටන් කරනවා. අම්මටයි නංගිටයි වහ දීලා මරනවා. ඒත් උඹෙ හොර ගෑණු විදිහට උන්ව තියාගණ්ඩ මම ජීවත් වෙනකම් උබට ඉඩදෙන්නේ නෑ"[20]

ඉහත උපුටා ගැනීම ඔස්සේ අපට නිරීක්ෂණය කළ හැකි නාගාර්ජුන්ගේ ප්‍රගතිශීලි දැක්ම අශුතෝෂ් රාය් විසින් සාකච්ඡාවට ලක් කරන ලද්දේ මෙසේ ය.

"අසාධාරණය සහ අයුක්තිය වෙනුවෙන් මේ සා එඩිතරව සටන් කරන පීඩිත පංතියේ නියෝජනයක් හින්දී නවකතා සාහිත්‍ය තුළ දී නැවත නැවත අපට හමු නොවන්නේය"[21]

19 එම, 35 පිටුව.

20 නාගාර්ජුන්.(1987). බල්චන්මා, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්, 74 පිටුව.

21 රාය්, ආශුතෝෂ්. (2006). නාගාර්ජුන් කා ගද්‍ය සාහිත්‍යය, නයී දිල්ලීːරාජ්කමල් ප්‍රකාශන්, 123 පිටුව.

වැටුප් නොලබන ළමා මෙහෙකරුවෙකු ලෙස බල්චන්මාගේ ළමා කාලය ගෙවී යන්නේය. නාගාර්ජුන් තමා ජීවත් වන සමාජයේ නග්න සත්‍ය 'බල්චන්මා' හි කුදු මහත් සෑම සිදුවීමක් කෙරෙන් ම විවරණය කරන්නේය. තවත් එක් උපුටා ගැනීමක් දෙසට අවධානය යොමු කරමු.

"නෝන හාමු සීතල වුණු රොටියක් එක්ක පිළුණු ව්‍යංජනයි, නරක් වුණු මුදවපු කිරියි මට ගෙනත් දීලා කාපං කියනවා. ඒකත් මම දාඩිය පෙරාගෙන පැය ගාණක් දර පැළුවට පස්සේ, ඊට පස්සේ කියනවා උඹලගේ අප්පා මුත්තලාටවත් මේ වගේ කෑමක් නම් ලැබිලා නැතුව ඇති."

මේ පිළිබඳ කුවර් සිංහ් සිය අදහස මෙසේ ප්‍රකාශ කරයි. "පනහ දශකයේ දී ඉන්දියාවේ ළමා මෙහෙකරුවන් පිළිබඳ සාකච්ජාව සංකීර්ණ මාතෘකාවක් විය. එහෙත් ළමා මෙහෙකරුවන් මුහුණ දුන් කටුක යථාර්ථය පිළිබඳ චිත්‍රණය සාහිත්‍ය තුළ දී පළමු වරට අපට හමු වන්නේ 'බල්චන්මා'ගෙනි."[22]

'බල්චන්මා' නවකතාවේදී නාගාර්ජුන් විසින් සාකච්ජාවට ළක් කරන ලද භාරතීය සමාජයේ මෙතෙක් ස්පර්ශ නොවූ පුළුල් අවකාශය පාඨක-විචාරක දෙපිරිසටම මඟහැර යා නොහැකි ය. නවකතාවේ බල්චන්මා අඩ ගොවියෙකි. අඩ කම්කරුවෙකි. ජීවිතය පුරාම ඔහු පීඩාවට, දරිද්‍රතාවයට, ප්‍රතික්ෂේපවීම්වලට අභිමුඛ වෙමින් ජීවිතය ගෙවයි. නාගාර්ජුන් විසින්ම පවසන ලද ආකාරයට බල්චන්මා තුළින් නිරූපනය වන්නේ ඉන්දියාවේ සියයට අසූවක ප්‍රතිශතයක් නියෝජනය කරන ජන-සමුදායක ජීවන යථාර්ථයයි. ජීවිතය පිළිබඳ යථාර්ථවාදී චිත්‍රය නිරූපණය කිරීමට පමණක් සීමා නොවන නාගාර්ජුන්, ක්‍රමයට එරෙහිව අරගල කරන බලවේගයක් නිර්මාණය කරන්නේ එකී ජන සමුදාය තුළිනි. එම අරගලය සංවිධානය කිරීමට නවකතාවේ ආඛ්‍යානයත්, චරිත වින්‍යාසයක් ගොඩනැගීමට නාගාර්ජුන් වැය කරන දේශපාලන ඥානය ඔහුගේ නවකතා සාහිත්‍යයේ ප්‍රගතිශීලී සාරාත්මකභාවය ලෙසට විචාරකයන් අතර සාකච්ජාවට ළක් වී තිබේ. ප්‍රේම්චන්ද් සතු වූ පුළුල් සාමාජික දෘෂ්ටිය අභිබවා නාගාර්ජුන් අරගලයට ප්‍රමුඛතාව දක්වන ආකාරය මෙහිදී නිරීක්ෂණය කළ හැකිය. හින්දී සාහිත්‍යයේ ප්‍රසිද්ධ විචාරකයෙකු සහ චින්තකයෙකු වන බච්චන් සිංහ් ඒ පිළිබඳ අදහස් දක්වන්නේ මෙසේය.

"බල්චන්මා නවකතාව ආරම්භ වන්නේ ගෝදානය අවසන් වන මංසලින් ය. ගෝදානයේ 'හෝරී' පළමුව ගොවියෙකුව සිට කුලී වැඩකාරකයෙකු බවට පත් වන්නේය. බල්චන්මා එක්තරා ආකාරයක කුලී වැඩකාරකයෙකු වෙයි. බල්චන්මා පත්ව සිටින්නේ සුරාකෑම නැමති දීර්ඝ ක්‍රියාවලියක දඩයමක් බවට ය. බල්චන්මා ජීවිතය පුරා අත්දුටු විවිධ සිදුවීම් කෙරෙන් පංති භේදය පිළිබඳ, දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔහු තුළ විරෝධය ගොඩනැගෙයි. බල්චන්මාගේ අභ්‍යන්තරයේ සිදුවන පරිවර්තනය අතිශය ස්වභාවික ලෙස කතුවරයා නිරූපණය කරන්නේය. බලයට එරෙහිව යුක්තිය වෙනුවෙන් ඔහු කරන සටන

22 ශර්මා, විෂ්ණුචංද්‍ර. (2001). නාගාර්ජුන් ඒක් ලම්බී ජිරහ්, නයී දිල්ලී :වාණී ප්‍රකාශන්, 181 පිටුව.

අවසානයේ දී ජයග්‍රහණය නොකරන්නේය. මන්දයත් සමාජ ක්‍රමයේ දැති රෝද කොතරම් සංකීර්ණ ලෙස නිර්මාණය වී ඇත් ද යත් ඉන් නිදහස් වී සිටීමට 'බල්චන්මා'ගේ අරගලකාරී ශක්තිය ඉවහල් නොවේ. එහෙත් ප්‍රතිවිරෝධී සමාජ ක්‍රමය තුළ ඔහුගේ අරගලය අනිවාර්ය සංසිද්ධියකි.[23]

මාක්ස්වාදය පිළිබඳ විශ්වාසයෙන් පසු වූ ලේඛකයෙකු ලෙස නාගාර්ජුන් තුළ පංති අරගලය පිළිබඳ දැඩි භක්තියක් පැවතිණි. ඔහු විසින් ම පවසන ලද්දේ මෙම ගණුදෙනුවේ දී ඔහු තම ඉෂ්ට දේවතාවන් ලෙස හඳුනාගන්නේ පොදු ජන සමුදාය වන බව ය.

මේ සම්බන්ධ ගෙනෙන්නේ නාගාර්ජුන් විසින් ම පවසන ලද ප්‍රකාශනයක් වෙත අවධානය යොමු කරමු. නාගාර්ජුන් පවසන්නේ,

"භාරතයේ වෙසෙන මුළු මහත් ජනගහණයෙන් සියයට අසූවක ප්‍රතිශතයක් වූ ගොවි-කම්කරු ජනයා මගේ ඉෂ්ට-දේවතාවෝ වෙති. මා අවට ජීවත් වන ඔවුන් සමඟ මාගේ ජීවිතය ගැට ගැසී තිබේ. මා අයත් නොවන පංතියක කතාවක් මාගේ ලේඛනයේ දී ඔබට හමු නොවෙයි. මක් නිසාද යත්, මා අයත් නොවන පංතියක් නියෝජනය කිරීම මට කළ නොහැකිය.[24]

නාගාර්ජුන්ගේ චින්තන පද්ධතිය විසින් ඔහුගේ සාහිත්‍යය අනිවාර්ය ලෙසට ප්‍රගතිශීලී එළඹුමක් වෙත රැගෙන ගිය ආකාරය උක්ත සඳහන් උපුටා ගැනීමෙන් පමණක් වුවද අපට නිරීක්ෂණය කළ හැකි ය.

නාගාර්ජුන් සාහිත්‍යකරුවෙකු ලෙස ප්‍රගතිශීලි ගුණවලින් සන්නද්ධ වූ ආකාරය ගාන්ධිවාදය කෙරෙහි ඔහුගේ දෘෂ්ටිවාදී ප්‍රවේශය ඔස්සේ විමර්ශනයට ලක්කළ හැකි ය. ධනවාදී සුරා කෑමෙන් භාරතය නිදහස් කර ගැනීමට ගාන්ධිවාදී ප්‍රතිපත්තිවලින් කිසිඳු පිළිසරණක් සිදු නොවන බව නාගාර්ජුන් දැඩි ලෙස විශවාස් කළ අතර ඒ වෙනුවෙන් පෙනී සිටීමට ද ඔහු එඩිතර වුයේ ය. ගාන්ධිගේ උපවාස ඔස්සේ සැබෑ නිදහස වෙනුවෙන් සිදු කෙරෙන අරගලය දියාරු වී යන බව නාගාර්ජුන්ගේ අදහස විය. නාගාර්ජුන් 'බල්චන්මා' ලවා මේ පිළිබඳව ප්‍රකාශ කරවන්නේ මෙසේ ය.

"මිනිස්සු පන්දාහක් එකට එකතු වෙලා, කපු රෙදිවලින් මහපු කුර්තා ඇඳගෙන, මල් මාලා දාගෙන, එළු රැලක් වාගේ මේ යන ගමන මට නම් විහිළුවක්. මේ විදිහට කවුද ස්වරාජ්‍යය දිනා ගන්නේ."[25]

නාගාර්ජුන් විසින් පිලිගනු ලැබූ දේශපාලන දෘෂ්ටියට අනුව, ගාන්ධිගේ අරගලය සමාජ ක්‍රමයේ පීඩනයට පත් පොදු-ජන සමූහයේ නිදහස වෙනුවෙන් පෙනී සිටින අරගලයක්

23 සිංහ්, බච්චන්. (2016). ආධුනික් හින්දී සාහිත්‍යයක ඉතිහාස්, නයී දිල්ලී: වාණී ප්‍රකාශන්, 359 පිටුව.
24 රාය්, ආශුතෝෂ්. (2006). නාගාර්ජුන් කා ගද්‍ය සාහිත්‍යය, නයී දිල්ලී:රාජ්කමල් ප්‍රකාශන්, 34 පිටුව.
25 නාගාර්ජුන්.(1987). බල්චන්මා, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්, 59 පිටුව.

නොවිණි. නාගාර්ජුන් ලේඛනයේ දී පමණක් නොව ව්‍යවහාර ජීවිතය කෙරෙන් ද විප්ලවීය සාරය සහිත අරගලකරුවෙකු වූහ. දේශපාලනික, ආර්ථික, සාමාජික පසුබිම පිළිබඳ අදහස මගහැර ජීවත් වීමට ඔහු අසමත් වන්නේ එබැවිනි.

නිදහසින් පසු යුගය වන විට ද භාරතිය සමාජය මූලික වශයෙන් වර්ණ නමින් හැඳින්වෙන සමාජ ස්තර හතරකට බෙදී තිබිණි. ක්ෂත්‍රීය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර නමින් හැඳින්වූ එම සමාජ ස්තරවල භේදයෙහි දිගුවක් ලෙස පැවතුණු 'අස්පර්ශ' නීතිය විසින් ශුද්‍ර ස්තරයට අයත් මිනිසුන් මනුෂ්‍යයින් ලෙස සළකනු නොලැබීය. නාගාර්ජුන් 'බල්චන්මා' නවකතාවේ දී මෙකී සමාජ භේදය පිලිබඳ චිත්‍ර ණය කරන්නේ භාරතීය සමාජය පෙන්වන කැඩපතක් විලසිනි.

"හාමු මහත්තයාගේ හාමිනේ කුණු හරුප කිය කියා මට දොස් කියනකොට මුලදී මුලදී මට දුක හිතුණා. ඊට පස්සේ මගේ කන් දෙක ඒවාට පදම් වෙලා ගියා. ඒ විදිහට බැනලා බැනලා උන්දැගේ තරහ නිවෙනකම් ම මම කරබාගෙන ඉන්නවා. බැනලා බැනලා තවත් මදි වෙද්දි ඉළපතක් අරගෙන උන්දෑ මට තඩි බානවා."[26]

බල්චන්මා අත්දකින මෙවැනි බොහෝ අත්දැකීම් කොතැනක හෝ ස්ථානයක, ඉන්දියානුවෙකුගේ අනුභූතියක් බවට පත් වූ නාගාර්ජුන්ගේ යුගයේ සමාජ යථාර්ථය විය. බල්චන්මා භාරතීය සමාජය ඉදිරියේ ලම්භකව තැබූ කැඩපතක් එහෙයිනි. මේ සම්බන්ධව රාම්දරශ් මිශ්‍රගේ අදහස මෙහි සටහන් කිරීම උචිත බව සිතමි.

"භාරතීය ගැමි ජනතාව කෙරෙහි ප්‍රේම්චන්ද් තුළ පැවති 'කරුණාව' නාගාර්ජුන් කෙරෙන් විහිදෙන්නේ 'විශ්වාසයක්' බවට පරිවර්තනය වීමෙනි. එය නිදහස වෙනුවෙන් සටන් කරන අරගලකරුවන් කෙරෙහි තැබූ දැවැන්ත විශ්වාසයකි."[27]

මීට සමාන අදහසක් ඉදිරිපත් කරමින් නාගාර්ජුන්ගේ නවකතා සාහිත්‍යයේ විශිෂ්ටත්වය පිළිබඳව සාකච්ඡා කරන ශෝභාකාන්ත් මිශ්‍ර ලියයි.

"ප්‍රේම්චන්ද්ගේ නවකතාවේ දී මෙන්ම නාගාර්ජුන්ගේ නවකතාව තුළ ද ගොවියා, කම්කරුවා, වැන්දඹුව මුහුණ දෙන අසාධාරණය, සූරාකෑම ආදී සමාජ අර්බුද සියල්ලම නිරීක්ෂණය කළ හැකි ය. එසේ ම ඊට එපිටින් සැඟවී ඇති සත්‍යයේ සෙවණැල්ල ද දැක ගත හැකි ය. 'ගෝදාන්යේ' ණය බරින් හුස්ම හිර වී මිය යන 'හෝරි' වැනි ගොවියන් වෙනුවට තමා ණයකරුවෙකු බවට පත් කළ සමාජක්‍රමයට එරෙහිව සටන් වදින ගොවියා නාගාර්ජුන්ගේ නවකතා තුළ දැක ගත හැකි ය. චිතක තුළ දැල්වී පිළිස්සී යන මිනිස් ආත්ම වෙනුවට, තමා පුළුස්සා දැමීමට සූදානම් කරන ලද චිතකයේ ගිනිදැල් අතරින් එළියට පැමිණීමට ධෛර්ය ඇති අලුත් පරම්පරාවක් ද දැකිය හැකි ය."[28]

**26** නාගාර්ජුන්.(1987). බල්චන්මා, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්, 62 පිටුව.
**27** මිශ්‍ර, රාම්දරශ්. (2006). හින්දි උපන්‍යාස් ඒක් අන්තර් යාත්‍රා, නයී දිල්ලී :ශාස්ත්‍රී ප්‍රකාශන්, 194 පිටුව.
**28** මිශ්‍ර, ශෝභාකාන්ත්.(1990). මේරේ බාබූජී නාගාර්ජුන්, නයී දිල්ලී:වාණී ප්‍රකාශන්, 122 පිටුව.

**සමාලෝචනය**

මේ අනුව භාරතයේ පොදු මිනිසා ලෙස, ප්‍රේම්චන්ද් විසින් නිර්මාණය කරන ලද ගෝදානයේ 'හෝරි' නිදහස් භාරතය තුළ 'බල්චන්මා' බවට පරිවර්තනය කරන ලද්දේ නාගාර්ජුන් විසිනි. එතැනදී, ප්‍රේම්චන්ද් විසින් ග්‍රහණය කරන ලද සකලවිධ සාමාජික ගැටළු නාගාර්ජුන් විසින් තම නවකතා සාහිත්‍යය තුළ චිත්‍රණය කරනු ලබන්නේ යුගය විසින් පරිවර්තනය කරන ලද දෘෂ්ටිමය ප්‍රවේශයක් ඔස්සේ ය.

කතා සංයෝජනය, භාෂා ශෛලිය, කලාත්මකභාවය යන තුන්වැදෑරුම් ගුණවල අපූරු සංහිඳියාවක් ලෙස නාගාර්ජුන්ගේ නවකතාව නිරීක්ෂණය කළ හැකි ය. මක් නිසාද යත් ඔහුගේ නවකතාව බිහිවන්නේ පරිපූර්ණ ලෙසටම මිනිස් ජීවිතය සම්මුඛ කරගනිමින් ය. එම නිසා කලාත්මකවාදයේ මෝහනයෙන් ඔහු අවසිහියට පත් නොවෙයි. නාගාර්ජුන්ගේ භාෂා ශෛලිය පොදු මිනිසාගේ ව්‍යවහාරයෙන් භින්න නොවෙයි. මෙම සංදර්භයේ දී නාගාර්ජුන් හින්දී සාහිත්‍යයේ තවත් එක් දැවැන්තයකු වන යශ්පාල් සමඟ සංසන්දනය කරමින් නාගාර්ජුන්ගේ ප්‍රගතිශීලී සීමාව පිළිබඳ අර්ථකථනයකට පැමිණිය හැකි ය. යශ්පාල් විසින් ස්වකීය දේශපාලන මතවාද කේන්ද්‍ර කරගනිමින් ඒවා ඉස්මතු වන ලෙස නවකතා රචනා කරනු ලැබූ ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. එම යුගයේ දීම නාගාර්ජුන්, මිනිස් ජීවිතය කේන්ද්‍ර කරගනිමින් ස්වකීය නවකතා රචනයේ යෙදෙයි. දේශපාලන විසංවාද, දේශපාලන සටන් පාඨ, කම්කරු ඉල්ලීම් සහ පක්ෂ අතර පොරබැදීම් යශ්පාල්ගේ නවකතා ආඛ්‍යානය වසා ගනිමින් ඉස්මතු වෙයි. ඒ වෙනුවට නාගාර්ජුන්ගේ නවකතාකරණයේ පළමු කොන්දේසිය ලෙස අපට හමුවන්නේ පොදු ජන සමුදායගේ ජීවිතය පිළිබඳ තීව්‍ර සංවේදීතාවයි.

අමානවීය සමාජක්‍රමයට එරෙහිව අරගලය සංවිධානය ප්‍රගතිශීලී පෙරහුරුව විදහා දක්වන 'බල්චන්මා' නවකතාව නාගාර්ජුන් ගේ පසුකාලීන නවකතාවලට පැහැදිලි ආලෝකයක් ලබාදෙන බව නිරීක්ෂණය කළ හැකිය. 'බල්චන්මා' නවකතාවට පසුව නාගාර්ජුන් විසින් රචනා කරන ලද බාබා බටේසර්නාත්, උග්‍ර තාරා, නයී පෝධ්, වරුණ් කේ බේටේ යන සෑම නවකතාවක් ඔස්සේම නිරූපණය වන්නේ පංති විරෝධය සහ ඊට එරෙහි අරගලය මෙහෙය වන බලවේගය පීඩිත පංතිය තුළින්ම නිර්මාණය වන ආකාරයයි. ඉහත නම් දරන සෑම නවකතාවකදීම පිබිදෙන තරුණ කණ්ඩායමක් විසින්, සාමාජික ගැටළු සහ සමාජ ක්‍රමයේ විකෘතිතා දේශපාලනිකව හඳුනාගන්නා ආකාරයත් ඒවාට විසඳුම් ප්‍රගතිශීලී දෘෂ්ටිමය ප්‍රවේශයක් තුළ ගවේෂණය කරන ආකාරයත් නිරීක්ෂණය කළ හැකි ය. එම නිසා ප්‍රේම්චන්ද් ගේ ගෝදාන් අවසන් වන යථාර්ථය තුළ අවසන් නොවන නාගාර්ජුන්ගේ බල්චන්මා නවකතාව යථාර්ථයේ විකල්ප චින්තනය තුළ අවසන් වෙයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

තල්වාර්, වීර්භාරත්. (2010). ප්‍රේම්චන්ද් ඖ'ර් කිසාන් ආන්දෝලන්, නයී දිල්ලී :වාණී ප්‍රකාශන්.

නාගාර්ජුන්. (1987). නයි පෝධ්, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්

නාගාර්ජුන්. (1987). බල්චන්මා, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්.

නාගාර්ජුන්. (1987). බාබා බටේසර්නාථ්, නයී දිල්ලී : රාජ්කමල් ප්‍රකාශන්.

බාබු, සෝෂ්ශේෂ්. (2006). ප්‍රගතිශිලී හින්දී ආලෝචනා ඒවං හින්දී කවිතා, නයී දිල්ලීඃ රාජ්කමල් ප්‍රකාශන්.

බාහ්රී හර්දේව් (?) බ්ර්හත් කෝෂ් නයී දිල්ලී :වාණී ප්‍රකාශන්.

මිශ්‍ර, රාම්දරශ්. (2006). හින්දි උපන්‍යාස් ඒක් අන්තර් යාත්‍රා, නයී දිල්ලී :ශාස්ත්‍රී ප්‍රකාශන්.

මිශ්‍ර, ශෝභාකාන්ත්. (1990). මේරේ බාබුජී නාගාර්ජුන්, නයී දිල්ලීඃවාණි ප්‍රකාශන්.

යාදව් සුරේන්ද්‍ර කුමාර්. (2012). නාගාර්ජුන් කා උපන්‍යාස් සාහිත්‍යය සමසාමයික් සන්දර්භ, නයී දිල්ලීඃ වාණී ප්‍රකාශන්.

රාය්, ආශුතෝෂ්. (2006). නාගාර්ජුන් කා ගද්‍ය සාහිත්‍යය, නයී දිල්ලීඃරාජ්කමල් ප්‍රකාශන්.

රැහ්බර් හංස්රාජ්. (2006). ප්‍රේම්චන්ද් ජීවන්, කලා ඖ'ර් කෘතිත්ව, දිල්ලී :සාක්ෂි ප්‍රකාශන්.

රැහ්බර් හංස්රාජ්. (?). ප්‍රගතිවාද්ඃ පුනර්මූල්යාන්කන්, ඉලාහ්බාද්ඃනවයුග් ප්‍රකාශන්. ප්‍රකාශන්.

විමලා, එම්. (2003). ප්‍රේම්චන්ද් කේ උපනාසාසෝ ̊ කී සමස්යා, නයී දිල්ලී :වාණී ප්‍රකාශන්.

ශර්මා, විෂ්ණුචංද්‍ර. (2001). නාගාර්ජුන් ඒක් ලම්බී ජිරැහ්, නයී දිල්ලී :වාණී ප්‍රකාශන්.

සිංහ්, නාම්වර්. (2016). ආධුනික් සාහිත්‍ය කී ප්‍රවෘත්තියා, ඉලාහ්බාද්ඃලෝක් භාරතී ප්‍රකාශන්.

සිංහ් නාම්වර්. (2010). ප්‍රේම්චන්ද් ඖ'ර් භාරතීය සමාජ්, නයී දිල්ලීඃරාජ්කමල් ප්‍රකාශන්.

සිංහ්, බච්චන්. (2016). ආධුනික් හින්දී සාහිත්‍යයක ඉතිහාස්, නයී දිල්ලීඃ වාණී ප්‍රකාශන්.

සිංහ්. විජයබහාදූර්. (1982). නාගාර්ජුන් රචනා සංසාර්, නයී දිල්ලීඃවාණි ප්‍රකාශන්.

සෝන්ටක්කේ, මාධව ගෝරේ, භාරතී (2011) නාගාර්ජුන් ඖ'ර් ප්‍රගතිශීලී සාහිත්‍යය, නයී දිල්ලිඃ ස්වරාජ ප්‍රකාශන්.